# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1608/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br><br>Date | 21/12/2023<br>පැය 2145 |

## මාධ්‍ය නිවේදනය

**නීති විරෝධී ලෙස ව්‍යාජ විදේශ ගමන් බලපත්‍ර, වීසා බලපත්‍ර ඇතුළු ලේඛණ මහා පරිමාණයෙන් මුද්‍රණය කිරීමේ ස්ථානයක් වටලා සැකකරුවන් දෙදෙනෙකු දේපල සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුර**

2023.12.20 වන දින පන්නල පොලිස් වසමේ ඇළබඩගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නීති විරෝධී ලෙස ව්‍යාජ විදේශ ගමන් බලපත්‍ර, වීසා බලපත්‍ර, විදෙස් අනුග්‍රහ ලිපි මහා පරිමාණයෙන් මුද්‍රණය කිරීමේ ජාවාරමක් පවත්වාගෙන ගිය ස්ථානයක් වටලා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 23 වයස් වල පසුවන පන්නල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පන්නල පොලිස් වසමේ අරෆා මාවත, ඇළබඩගම, පන්නල ලිපිනයේ පිහිටි නිවසක වැටලීම සිදු කර ඇති අතර දීර්ඝ කාලයක සිට මහා පරිමාණයෙන් මෙම ජාවාරම සිදු කර ඇති බව දැනට සිදු කරන ලද විමර්ශනවලදී අනාවරණය වී ඇත. සැකකරුවන් සන්තකයේ තිබී ලැප්ටොප් යන්ත්‍ර 03 ක්, ප්‍රින්ටර් යන්ත්‍ර 08 ක්, ජංගම දුරකථන 02 ක්, පෙන් ඩ්‍රයිව් 02 ක්, රේඩියම් ස්ටාර් චෙක් මැෂින් 02 ක්, යූ.පී.එස්. එකක්, විවිධ පුද්ගලයින්ට අයත් විදෙස් ගමන් බලපත්‍ර 24 ක්, නිල මුද්‍රා ඇතුළු විවිධ ලිපි ලේඛන රැසක් සහ දේපල පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් හා දේපල වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළඳාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත භාර දී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**